### 1.6 විශේෂාංග රූප සටහන්
### ආර්ථික අර්බුදයෙන් පසු ජාත්‍යන්තර සංචිත නැවත යථා තත්ත්වයට පත් වීම




ශ්‍රී ලංකාවේ දළ නිල සංචිත සහ ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වය කැපී පෙනෙන ලෙස නැවත යථා තත්ත්වයට පත් වීමක් වාර්තා කළේය. 2021 වසරේ සිට චීන මහජන බැංකුව සමඟ වූ විදේශ විනිමය හුවමාරු පහසුකම ද ඇතුළත් වූ රටෙහි දළ නිල සංචිත තත්ත්වය, 2022 වසරේ දී අවම මට්ටමකට පත් වූ අතර, ඒ හේතුවෙන් රජය විසින් ණය සේවාකරණය තාවකාලිකව අත්හිටුවීමක් ප්‍රකාශයට පත් කරන ලදී. සංචිත ආශ්‍රිත වගකීම් ද සැලකිල්ලට ගනු ලබන රටෙහි ශුද්ධ ජාත්‍යන්තර සංචිත තත්ත්වය 2022 වසරේ දී සෘණ තත්ත්වයක පැවති අතර, එය ඉතිහාසයේ වූ අවම මට්ටම වේ. කෙසේ වුවත්, ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම යටතේ වන නිර්ණායක සැපිරිය යුතු මට්ටම ද ඉක්මවමින් වත්කම් ඉහළ නංවා ගැනීමට මහ බැංකුවට හැකි වූ අතර, සෘජු මිලදී ගැනීම් සහ ජා.මූ. අරමුදලේ විස්තීර්ණ ණය පහසුකම ආශ්‍රිත බහුපාර්ශ්වික අරමුදල් ද මෙම ක්‍රියාවලියට සහාය විය. ඉන්දියානු සංචිත බැංකුව සමඟ පවතින විශේෂ විදේශ විනිමය හුවමාරු පහසුකම සම්බන්ධ ණය සේවාකරණ ගෙවීම් සිදු කිරීම හමුවේ සංචිත ආශ්‍රිත වගකීම් ද අඩු විය. එබැවින්, අර්බුදයෙන් පසුව සංචිතවලට අදාළ V-හැඩැති නැවත යථා තත්ත්වයට පත් වීම, දළ නිල සංචිතවල සැලකිය යුතු වැඩි වීමෙහි මෙන්ම මහ බැංකුවේ වගකීම්වල අඛණ්ඩ අඩු වීමෙහි ද ඒකාබද්ධ ප්‍රතිඵලයකි.